**Provincial Department of Education- Sabaragamuwawa**

**Sathi Pasala**

Subject : JAPANESE LANGUAGE

Week: 7

Grade: 11

Prepared by: Imasha Silva
Kg/Mw Parakrama M.V,rambukkana

Unit 30

# すてきな　とけいですね。

## හරිම ලස්සන ඔරලෝසුවක්නේ...

## こはる can- do

ともだちの　ものを　ほめたり、それに　こたえる　ことが　できます。

යහළුවන් සතු ද්‍රව්‍ය සහ දක්ෂතාවයන් අගය කරමින් ඒවාට පිළිතුරු ලබා දීමට හැකියාව ලැබේ.

カスン　：　こはるちゃん、すてきな　とけいですね。
කොහරු,ඔයාගේ ඔරලෝසුව හරිම ලස්සන ඔරලෝසුවක්නේ.....

こはる　：　ありがとうございます。
ස්තුතියි



ඉහත දෙබසෙහි දක්වා ඇති ආකාරයට යහළුවන් සතු දේ අගය කිරීමට ප්‍රශංසනාත්මක වචන භාවිතා කරයි.ඒවා ජපන් භාෂාවෙන් "ほめことば" ලෙස හැඳින්වේ.එවැනි ප්‍රශංසනාත්මක වචන කිහිපයක් පහතින් දක්වා ඇත.

- ✓ きれいな - Beautiful , Neat , Clean
- ✓ すてきな- Lovely , Beautiful , Fantastic
- ✓ かわいい - Cute , Adorable , Tiny
- ✓ かっこいい - Good looking , Attractive , Stylish

❖ ඉහත ප්‍රශංසනාත්මක වචන වාක්‍යයක් තුල භාවිතා කිරීමේදී අදාල වචනයට පසු නාම පදය යෙදීම සිදු වේ.

| ほめことば + Noun |
|---|

උදා :


① きれいな　スカート

ලස්සන සායක්



② かっこいい　ジーンス

ඉතා ආකර්ෂණීය දිග කලිසමක්



③ かわいい T シャツ

හුරුබුහුටි ටී ෂර්ටයක්



れんしゅう:　❶ දී ඇති රූපය බලා හිස්තැන් පුරවන්න.



きれいな...............................



すてきすてきな...............................



かわいい...............................



かっこいい...............................

❷ CD 12,14,15,16 ට සවන් දී අභ්‍යාස සම්පූර්ණ කරන්න.

❸ඉහත දෙබසට සමාන දෙබසක් තමන් විසින් නිර්මාණය කරන්න.

※ ඉහතින් අප දැක්වූයේ යම් කිසි ද්‍රව්‍යයක් අගය කරන ආකාරයයි.එසේම මේ ආකාරයට යහළුවෙකු සතු යම් දක්ෂතාවයක්ද ඇගයීමට ලක් කල හැක. ඒ පිළිබඳ අධ්‍යයනය කිරීමට පහත සංවාදය දෙස බලන්න.

カスン　：　こはるちゃん、サッカーが　じょうずですね。

කොහරු, ඔයා පාපන්දු වලට ගොඩක් දක්ෂයිනේ...

こはる　：　ありがとう　ございます。

ගොඩක් ස්තූතියි



❖ මේ ආකාරයට යහළුවෙකුගේ දක්ෂතාවයන් අගය කිරීමට හැකියාව ඇත.

අපි තවත් දෙබසක් සඳහා යොමු වෙමු.

こはるちゃん、えいごが　じょうずですね。

කොහරු, ඉංග්‍රීසි වලට ගොඩක් දක්ෂයිනේ.....




いいえ、まだまだです。

නැහැ, එතරම්ම නැහ

❖ යහළුවෙකුගේ දක්ෂතාවයක් අගය කිරීමේදී,එම දක්ෂතාවය දක්වන නාම පදයට පසු が නිපාතයද ඉන්පසු じょうずですね යන්නත් එක් කිරීමෙන් වාක්‍ය සකසා ගත හැක.

**Noun + が + じょうずですね**

උදා :



① すいえい　が　じょうずですね
පිහිනීමට දක්ෂයිනේ



② ギター　が　じょうずですね
ගිටාර් වාදනයට දක්ෂයිනේ

③ にほんご　が　じょうずですね
ජපන් භාෂාවට දක්ෂයිනේ

එහෙත් මෙහිදී විශේෂයෙන් මතක තබා ගත යුතු කරුණක් නම්, **මෙම ව්‍යාකරණ අංගය තුලදී නාම පදය ලෙස භාවිත කල හැක්කේ ක්‍රීඩාවක්, විදේශ භාෂාවක්, වාද්‍ය භාණ්ඩයක් සේම ගායනය , චිත්‍ර ඇඳීමේ හැකියාව ආදියයි.** පාසල තුල අධ්‍යාපනය ලබන අනිකුත් විෂයයන් සඳහා ඇති දක්ෂතාවය ප්‍රකාශ කල නොහැක. එසේම මෙහිදී යහළුවාගේ හැකියාව දෙස බලා සිට එය අගය කරනු ලැබේ.

මෙහිදී 「*がじょうずですね」ලෙස අගය කල අවස්ථාවකදී 「ありがとうございます」 **( ස්තුතියි)** ලෙස හෝ 「いいえまだまだです」 **(නැහැ තවම නැහැ)** ලෙස පිළිතුරු ලබා දිය හැක.

れんしゅう:

❶ දී ඇති රූපය බලා හිස්තැන් පුරවන්න.



--------------------------------------- が じょうずですね



--------------------------------------- が じょうずですね




--------------------------------------- が じょうずですね



--------------------------------------- が じょうずですね

❷ ඉහත සංවාද හොඳින් කියවා යහළුවාගේ සහ ඔබගේ දක්ෂතාවයන් අගය කරමින් සිදුවන සංවාදයක් ගොඩනගන්න.